නිවාස හා සමෘද්ධි අමාත්‍යාංශය
tPlk;G kw;Wk; rKh;j;jp mikr;R
Ministry of Housing & Samurdhi

මගේ අංකය / எனது இல / My No } DDD/HO/MF/BANK

ඔබේ අංකය / உமது இல / Your No }........................................

දිනය / திகதி / Date }.......2015.02..25...........

# දිවිනැගුම සංවර්ධන දෙපාර්තමේන්තුව
# வாழ்வின்எழுச்சி அபிவிருத்தி திணைக்களம்
# Department of Divineguma Development

4 මහල, සෙත්සිරිපාය, බත්තරමුල්ල.
4 tJ khb nrj;rpupgha gj;juKy;y
4 floor, Sethsiripaya ,Battaramulla

සියළුම ප්‍රජාමූල බැංකු කළමනාකරුවන් වෙත.

**දිවිනැගුම චක්‍රලේඛ අංක 2015/02**
**දිවිනැගුම ප්‍රජාමූල බැංකු අංශය**

## දිවි නැගුම ප්‍රජාමූල බැංකු මගින් නව සහනාධාර ලාභීන් සඳහා හඳුන්වා දෙනු ලබන රු.100,000 දිවිනැගුම දිරිය සවිය ණය යෝජනා ක්‍රමය

1. හැදින්වීම:-

මේ වන විට දිවි නැගුම සහනාධාර ලබන ප්‍රතිලාභීන්, දිවි නැගුම ප්‍රජා මූල බැංකු වල සාමාජිකත්වය ලබා ඇති අතර එම පුද්ගලයින් බැංකු ණය පහසුකම් සඳහා හිමිකම් ලබා ඇත.

මෙම සහනාධාරලාභීන්ට අමතරව අළුතින් සහනාධාර ලැබිය යුතු පවුල් මේ වන විට හදුනා ගනිමින් පවතින අතර එලෙස හදුනා ගන්නා අය සඳහා නව සහනාධාර නිකුත් කරන තෙක් දිවි නැගුම ප්‍රජා මූල බැංකුව මගින් ඔවුන් වෙතද මූල්‍ය පහසුකම් සලසා දිම මෙම ණය වැඩසටහන තුළින් අපේක්ෂා කෙරේ.

**1.1** මෙම ණය ක්‍රමය ක්‍රියාත්මක කිරීමේ දී පහත දැක්වෙන උපදෙස් අනුගමනය කරන ලෙස කාරුණිකව දන්වමි.

**2. ණය ලබා ගැනීම සඳහා සුදුසුකම් ලබන අය:-**

2.1 අලුතින් දිවිනැගුම සහනාධාර සඳහා හඳුනාගත් එනම් සහනාධාර අලුතින් ලැබීමට නියමිත සියලුම පවුල් මේ සඳහා සුදුසුකම් ලබයි.

2.2 සහනාධාර කාඩ්පත් හිමිවන නව පවුලේ ගෘහ මූලිකයා හෝ ඔහුගේ/ඇයගේ කලත්‍රයාට මේ යටතේ ණය ලබාගැනීමට ඉදිරිපත් විය හැකිය.

2.3 දිවිනැගුම ප්‍රජා මූල බැංකු ණය වැඩ සටහන් යටතේ මීට පෙර කිසිදු ණය මුදලක් ලබා ගෙන නොමැති පවුලක් විම.

**3. ණය ලබා දීමේ ක්‍රමවේදය:-**

3.1 දැනට දිවි නැගුම ප්‍රජා මූල බැංකු ණය ලබා දීමේදී අනුගමනය කරනු ලබන ක්‍රමවේදය අනුව මෙම අයද කණ්ඩායම්ගත කිරීම සිදු කළ යුතුය.ඒ සඳහා දැනට අඩු සාමාජිකයන් සිටින කණ්ඩායමකට සාමාජිකයන් ඇතුලත් කිරීම හෝ අලුතින් කණ්ඩායම් ගත කිරීම සිදුකල යුතුය.

3.2 බැංකු සාමාජිකත්වය පිරිනැමීමට කටයුතු කර උපරිම ණය මුදල ලබාගැනීමට රු.500/- ක එක කොටසක් මිලදී ගැනීම ප්‍රමාණවත් වේ.

දිවිනැගුම ප්‍රජාමූල බැංකු ණය වැඩසටහන යටතේ පළමුවෙන් ණය මුදලක් ඉල්ලුම් කිරීමේ දී සාමාජිකත්වය ලබා මාස 03 ක් ඉක්මවීමේ යන කොන්දේසිය මෙම ණය වැඩසටහනට අදාල නොවේ. බැංකු සාමාජිකත්වය ලබා ගත් සැනෙකින් ණය පිරිනැමීමට හැකියාව ඇත.

## 4. ලබා දිය හැකි උපරිම ණය සීමාව:-

4.1 උපරිම ණය මුදල රු.100,000/- කි.

4.2 ණය මුදල ආපසු අය කරගැනීම වසර 01 ක සහන කාලයකින් අනතුරුව මාස 36 ක උපරිමයකට සීමා වේ. සහන කාලය සඳහා පොලී අය කිරීමක් සිදු නොකරයි. කෙසේ නමුත් සහන කාලයක් අවශ්‍ය නොවන විටක මාස 36 ක කාලසීමාවකින් ණය මුදල ගෙවා අවසන් කිරීමට ඉඩදෙනු ලැබේ.

4.3 මෙම ණය වැඩසටහන යටතේ ණය මුදලක් ඉල්ලුම් කළ හැක්කේ එක වරක් පමණි.

## 5. වාර්ෂික පොලී අනුපාතය:-

5.1 වාර්ෂික පොලී අනුපාතය 2% ක් වේ.

5.2 සමාන වාරික වශයෙන් ණය ආපසු අය කරගත යුතුය. සමාන වාරික ගණනය කිරීම සඳහා උපරිම ගිවිසුම් ගත කාලය සඳහා පොලිය ගණනය කර ණය මුදල එකතු කර, ආපසු ගෙවීම් කාලයෙන් බෙදා සමාන වාරික මුදල ගණනය කළ යුතුය.

5.3 මෙම ණය පොලී සඳහා සහන පොලියක් ලබාදීම සිදු නොකෙරේ.

## 6. ණය මුදල් ලබාදෙන කාරණා:-

6.1 දැනට ක්‍රියාත්මක හෝ ක්‍රියාත්මක කිරීමට අපේක්ෂිත සුළු කර්මාන්ත, සේවා, වෙළෙඳ, කෘෂිකාර්මික, සත්ත්ව පාලන හා ධීවර වැනි ආදායම් උත්පාදන ස්වයංරැකියා ව්‍යාපෘති සඳහා ණය නිකුත් කිරීම කළ යුතුය.

6.2 ණය ඉල්ලුම් පත්‍රය සමග ණය ඉල්ලුම් කරන ව්‍යාපෘතිය සම්බන්ධව ව්‍යාපෘති වාර්තාවක් සකස් කල යුතුය. ඒ සඳහා ඇමුණුම් 02 ආකෘති පත්‍රය භාවිතා කල යුතුය.

## 7. ඇප සුරැකුම්:-

7.1 මෙම ණයලාභීන් කණ්ඩායම් සඳහා දායක කර ගැනීම සිදුකළ යුතු බැවින් කණ්ඩායම් සාමාජිකයින්ගේ ඇපය ප්‍රමාණවත් වේ.

7.2 මෙම ණයලාභීන් නව කණ්ඩායමක් ලෙස කණ්ඩායම් ගත වේ නම් එක් එක් ණයලාභීන් රු.500/- ක් බැගින්, ණය තැන්පතු මුදලක් තැබිය යුතු අතර, පවතින කණ්ඩායමක එකතු වී ණය ගන්නේ නම් ණයලාභියා පමණක් රු.500/- ක ණය තැන්පතු මුදලක් තැබීම ප්‍රමාණවත් වේ.

7.3 මෙම තැන්පතුව මත කණ්ඩායමේ සියලුදෙනාට ණය ඉල්ලුම් කිරීමේ හැකියාව ලබා දේ.

7.4 ඉහත 7.1 හා 7.2 හි සඳහන් පරිදි කණ්ඩායම් ඇපය ඉදිරිපත් කිරීමට නොහැකි හෝ ඉදිරිපත් කරන කණ්ඩායම් ඇපය පිළිබඳ සෑහීමකට පත් නොවන අවස්ථාවක රාජ්‍ය / අර්ධ රාජ්‍ය සේවයේ නිරත නිලධාරීන් දෙදෙනෙකුගේ ඇපය ලබා ගත යුතුය. ඇප ඉදිරිපත් කරන නිලධාරීන්ගේ සේවා කාලය (විශ්‍රාම යාමට පෙරතුව) ඇප අත්සන් කරන දින සිට ඉදිරියට තව දුරටත් අවම වශයෙන් වර්ෂ 4ක් හෝ ඊට වැඩි විය යුතුය.

## 8. ණය අනුමත කිරීම හා ගිණුම් ගත කිරීම :-

8.1 දැනට බැංකුවේ පවතින ක්‍රමවේදය යටතේ ණය නිදහස් කිරීම පාලක මණ්ඩල අනුමැතියෙන් අනතුරුව සිදුකළ යුතුය. ඒ සඳහා දිවිනැගුම බැංකු කළමනාකරු ණය ඉල්ලීම් සළකා බලා අදාල නිර්දේශයන් ලබාදිය යුතුය.

8.2 ණය මුදාහැරීමේ දී පහත ගිණුම් සටහන් තැබිය යුතුය.
ලැබිය යුතු ණය ගිණුම - දිවිනැගුම දිරිය සවිය - හර(කේත අංක 3116.)

ණය වාරික මුදල් හා පොලිය අය කරගැනීම
සාමාජික තැන්පතු ගිණුම - හර
ලැබිය යුතු ණය ගිණුම - දිවිනැගුම දිරිය සවිය - බැර (මාසික වාරික මුදල)
ලද පොලී ගිණුම - දුන් ණය ගිණුම - බැර (මාසික පොලී මුදල)

8.4 මෙම ණය වැඩසටහන සඳහා ණය සංරක්ෂණ අදාල කරගත යුතු වේ.

8.5 මෙම ණය වැඩසටහන යටතේ හිතාමාතා හෝ ස්වාභාවික හේතූන් මත ණය ගෙවීම් පැහැර හැරීමේ දී අපගේ මෙහෙයුම් උපදෙස් පරිදි ක්‍රියාකර ණය මුදල් ආපසු අය කර ගත යුතුය.

**9. වෙනත් :-**

9.1 මෙම ණය වැඩසටහන සඳහා අවශ්‍ය පුද්ගලික ලෙජර්, ණය රෙජිස්තර, පාලන ලෙජර්, ණය කාඩ්, ණය ගිවිසුම් දැනට හඳුන්වා දී ඇති ලිපිද්‍රව්‍ය භාවිතා කළ යුතුය.

9.2 මෙම ණය වැඩසටහන යටතේ ණය ඉල්ලුම කිරීමේ දී ඇමුණුම 01 ආකෘති පත්‍රය භාවිතා කළ යුතුය.

**10. ප්‍රගතිය වාර්තා කිරීම:-**

10.1 මාසික ප්‍රගති වාර්තා, පුද්ගලික ණය ශේෂ පිරික්සුම් අපගේ මෙහෙයුම් උපදෙස් පරිදි සිදුකර අවශ්‍ය පරිදි යොමුකළ යුතුයි.

10.2 මෙම නව චක්‍රලේඛයේ උපදෙස් වලට අමතරව අනෙකුත් උපදෙස් අපගේ ණය මෙහෙයුම් උපදෙස් පරිදි කටයුතු කිරීමට තවදුරටත් දන්වා සිටිමි.

ආර්.ඒ.ඒ.කේ. රණවක
අධ්‍යක්ෂ ජනරාල්

පිටපත් :
1. ලේකම්, නිවාස හා සමෘද්ධි අමාත්‍යාංශය - කා.දැ.පි
2. දිස්ත්‍රික් ලේකම්/ අතිරේක අධ්‍යක්ෂ ජනරාල් - කා.දැ.පි
3. ප්‍රධාන ගණකාධිකාරී, දිවිනැගුම සංවර්ධන දෙපාර්තමේන්තුව. - කා.දැ.පි
4. ප්‍රධාන අභ්‍යන්තර විගණක, දිවිනැගුම සංවර්ධන දෙපාර්තමේන්තුව. - කා.දැ.පි
5. විගණකාධිපති, - කා.දැ.පි
6. දිස්ත්‍රික් දිවිනැගුම අධ්‍යක්ෂ. - කා.දැ.පි
7. ප්‍රාදේශීය ලේකම්, ප්‍රාදේශීය ලේකම් කාර්යාලය. - කා.දැ.පි
8. ප්‍රාදේශීය දිවිනැගුම නිලධාරී. - කා.දැ.පි
9. කළමණාකරු - දිවිනැගුම ප්‍රජා මූල බැංකු සමිතිය - අ.ක.ස.

ඇමුණුම් 01

# දිවි නැගුම ප්‍රජාමූල බැංකු මගින් නව සහනාධාර ලාභීන් සඳහා හඳුන්වා දෙනු ලබන රු.100,000 දිවිනැගුම දිරිය සවිය ණය යෝජනා ක්‍රමය සඳහා ඉල්ලුම් පත්‍රය.

| කාර්යාලීය ප්‍රයෝජනය පිණිසයි. | | | ඉල්ලුම් පත් අංකය :- | |
|---|---|---|---|---|
| ලද දිනය | ණය වාරිකය | වාරිකය අය විය යුතු දිනය | ණය ගිවිසුම් අංකය | |
| මුදාහල දිනය | | | | |
| | | | ණය වර්ගය | |

.................................................................................... දිවිනැගුම ප්‍රජා මූල බැංකුව

ඉල්ලුම්කරු පිළිබඳ විස්තර

මුලකුරු සමඟ නම :- .................................................................... මයා/මිය

මුලකුරුවලින් හැඳින්වෙන නම් :- ....................................................................

ස්ථිර ලිපිනය :- ....................................................................

....................................................................

ජාතික හැඳුනුම්පත් අංකය :- ☐☐☐☐☐☐☐☐☐

උපන් දිනය :- ....................................................................

බැංකු සාමාජික අංකය :- ☐

සාමාජික තැන්පත් ගිණුම් අංකය :- ☐

ඉල්ලුම් කරන ණය මුදල :- රු. ....................................................................

ණය මුදල යෙදවීමට අපේක්ෂිත කාරණය :- ....................................................................

....................................................................

....................................................................

මේවන විට බැංකුවෙන් ණය ලබාගෙන තිබේනම් එහි ශේෂය රු. :- ....................................................

.................................................... ....................................................

දිනය අයදුම්කරුගේ අත්සන

**සංවර්ධන නිලධාරිගේ නිර්දේශය :-**

මෙම ණය අයදුම්කරු ණය මුදල ලබා ගැනීමට අවශ්‍ය සුදුසුකම් සියල්ල සපුරා ඇති බවත් ඒ අනුව රු. ....................................... ක ණය මුදල ලබාදීම සුදුසු බවත් නිර්දේශ කරමි. ඒ සමගම ණය මුදල මුදා හල පසුව ආපසු අය කර ගැනීමට අවශ්‍ය කටයුතු කිරීමට සටහන් කර ගතිමි.

දිවිනැගුම සංවර්ධන නිලධාරිගේ නම :- ..........................................................

අත්සන හා නිළ මුද්‍රාව :- ..........................................................

දිනය :- ..........................................................

**දිවිනැගුම කළමණාකරුගේ නිර්දේශය :-**

ඉහත නම සඳහන් අයදුම්කරු ...................................................................... දිවි නැගුම ප්‍රජා මූල බැංකුවේ සාමාජිකත්වය දරණ අය බැවින් ඔවුන්ගේ එම ණය මුදල නිකුත් කිරීම සඳහා නිර්දේශ කරමි.

........................................... ..................................................... .......................................

දිනය බැංකු කළමණාකරුගේ නම අත්සන හා නිල මුද්‍රාව

**පාලක මණ්ඩල අනුමැතිය :-**

ඉහත නම සඳහන් අයදුම්කරු ...................................................................... දිවි නැගුම ප්‍රජා මූල බැංකුවේ සාමාජිකත්වය දරණ අය බැවින් ඔවුන්ගේ එම ණය මුදල අනුමත කරමි.

........................................... .....................................................

දිනය පාලක මණ්ඩල සභාපති

## දිවිනැගුම දිරිය සවිය ණය යෝජනා ක්‍රමය

## ව්‍යාපෘති වාර්තාව

1. ණය අයදුම්කරුගේ සම්පූර්ණ නම (සාමාජිකයාගේ නම)

2. ලිපිනය

2.1 ස්ථිර ලිපිනය

2.2 තැපැල් ලිපිනය

3. ග්‍රාම නිලධාරි වසම :-

4. දිවිනැගුම ප්‍රජා මූල බැංකු සංගමය :-

5. ජාතික හැඳුනුම්පත් අංකය :-

6. දුරකථන අංකය :-

7. ව්‍යාපාර ලියාපදිංචි අංකය (තිබේ නම්) :-

8. ව්‍යාපෘතිය ආරම්භ කළ වර්ෂය :-

9. දිවිනැගුම දිරිය සවිය ණය මුදල යොදන ව්‍යාපෘතිය :-

10. අපේක්ෂිත ණය මුදල රු. :-

11. ඉතුරුම් ගිණුම් පිළිබඳ විස්තරය

| බැංකුව/ බැංකු සමිතියේ නම | ගිණුමේ | | ශේෂය රු. .................. දිනට |
|---|---|---|---|
| | නම | අංකය | |
| | | | |
| | | | |
| | | | |
| | | | |

13. ලබාගත් ණය පිළිබඳ තොරතුරු (ගෙවමින් පවතින)

| බැංකුව/ බැංකු සමිතිය නම | ණය මුදල | | පිටහිටි ණය මුදල ............. දිනට | ගෙවා අවසන් කල යුතු දිනය | ඇප පිළිබඳ විස්තර |
|---|---|---|---|---|---|
| | ලබාගත් දිනය | මුදල රු. | | | |
| | | | | | |
| | | | | | |
| | | | | | |

14. දැනට ව්‍යාපාරය/ ව්‍යාපෘතිය සඳහා ආයෝජන කරන ලද වත්කම්.

| විස්තරය | දළ වටිනාකම රු. |
|---|---|
| ම් අක්/පර්චස් ........................ | |
| ගොඩනැගිලි ව.අඩි........................ | |
| iii. වාහන | |
| iv. යන්ත්‍ර සූත්‍ර | |
| v. උපකරණ (ජීව කාලය අවු. 5 ට වැඩි) | |
| vi.................................. | |
| vii.................................. | |
| එකතුව | |

<u>සැ.යුතුය :-</u>

සත්ත්ව පාලන ව්‍යාපෘතියක් නම් සතුන් පිළිබඳ තොරතුරු ඇතුලත් කළ යුතුයි.

15. අපේක්ෂිත ව්‍යාපෘතිය ව්‍යාප්ත කිරීම ( Expansion )

| | |
|---|---|
| නිෂ්පාදන ප්‍රමාණය ඉහළ නැංවීම | |
| තත්ත්වය වැඩි දියුණු කිරීම. | |
| නිෂ්පාදනය සංවර්ධනය කිරීම. | |
| අලෙවිය ව්‍යාප්ත කිරීම. | |
| වෙනත් | |

16. ව්‍යාපෘතිය සඳහා අරමුදල් ගලා ඒම්/ ගලායැම් සටහන (අපේක්ෂිත)

| පිරිවැය ඒකකය | මුදල් මූලාශ්‍රය | | | එකතුව රු. |
|---|---|---|---|---|
| | ව්‍යාපෘතිලාභියාගේ දායකත්වය රු. | දිවිනැගුම දිරිය සවිය ණය රු. | වෙනත් ප්‍රභවයන් | |
| විස්තරය | | | | |
| i. ඉඩම්. | | | | |
| ii. ගොඩනැගිලි . | | | | |
| iii. වාහන. | | | | |
| iv. යන්ත්‍ර සූත්‍ර. | | | | |
| v. කාරක ප්‍රාග්ධනය<br>* අමුද්‍රව්‍ය<br>*......................<br>*...................... | | | | |
| | | | | |

17. සේවා නියුක්ති තත්ත්වය.

| විස්තරය | සේවක ගණන | | එකතුව |
|---|---|---|---|
| | ස්ථිර | අනියම්/ කොන්ත්‍රාත් | |
| දැනට නිරත සේවක සංඛ්‍යාව | | | |
| සේවක සංඛ්‍යාව අපේක්ෂිත | | | |

18. ලාභදායකත්වය පුරෝකථනය (ඉදිරි වර්ෂ 5 ක් සඳහා)

| ආදායම්/ වියදම | වසර (රුපියල්) | | | | |
|---|---|---|---|---|---|
| | I | II | III | IV | V |
| පිරිවැටුම/ ආදායම | | | | | |
| අඩු කළා | | | | | |
| විකුණුම් පිරිවැය | | | | | |
| දල ලාභය | | | | | |
| අඩු කළා | | | | | |

| | | | | | |
|---|---|---|---|---|---|
| [illegible] ශ්‍රමය, ද්‍රව්‍ය [illegible]මවල එකතුව) | | | | | |
| [illegible]ාභය | | | | | |
| අඩු කළා | | | | | |
| ණය වාරික හා පොලී වියදම | | | | | |
| ශුද්ධ ලාභය | | | | | |

19. ලබාගත්/ අපේක්ෂිත පුහුණුව හා ශිල්පීය කුසලතාවන්.

| පුහුණුව/ ශිල්පීය කුසලතාව | ලබාගත් ආයතනය | ව්‍යාපෘතියට අදාලවේ/ නොවේ. | ඉල්ලුම් කරන පුහුණුව/ ශිල්පීය කුසලතාවය |
|---|---|---|---|
| i. කළමනාකරණය | | | |
| ii.ගිණුම් හා මූල්‍ය කටයුතු . | | | |
| iii. සේවක කළමනාකරණය. | | | |
| iv. ශිල්පීය කුසලතාව. | | | |
| ................................ | | | |
| ................................ | | | |
| ................................ | | | |

මා විසින් පෞද්ගලිකව ව්‍යාපෘතිය හා පොත්පත් පරික්ෂා කිරිමෙන් අනතුරුව ව්‍යාපෘතිය පිළිබඳ ඇගයිමක් සිදු කරන ලද බවත්, ........................................................................... මහතා/ මිය/ මෙනවියට රු............................ මුදලක් .......................................... ව්‍යාපෘතිය වෙනුවෙන් දිවිනැගුම දිරිය සවිය ණය යෝජනා ක්‍රමය යටතේ ලබාදීම සුදුසු/ නුසුදුසු බව නිර්දේශ කර අවශ්‍ය කටයුතු සඳහා ඉදිරිපත් කරමි.

නම :-

දිනය :-

නිල මුද්‍රාව :-

කළමණාකරු
දිවිනැගුම ප්‍රජා මූල බැංකුව

.......................................

ව්‍යාපෘති කළමණාකරුගේ අත්සන.
දිවිනැගුම ප්‍රජා මූල බැංකු සමිතිය

................................................................ යන අයගේ ..............................................ව්‍යාපෘතිය / කාර්ය සඳහා සකස් කරන ලද ව්‍යාපෘති වාර්තාව අවශ්‍ය කටයුතු සඳහා යොමු කරමි.

කළමණාකරු
දිවිනැගුම ප්‍රජා මූල බැංකු සමිතිය
(නිල මුද්‍රාව තබන්න)